කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
නීති පීඨය
නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර (මාර්ගගත) - 2019 (පුනරීක්ෂණ)

# රෝම නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: හයයි (06)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

01. (i) සහ (ii) කොටස් **දෙකටම** පිළිතුරු ලියන්න.

(i) නිදහස් කර ගැනීමේ නිත්‍ය අයිතිය ඔවුන් වෙත රඳවා තබා ගනිමින් ඔවුන්ගේ අලුත උපන් දරුවා, වහල්භාවය සඳහා විකිණීමට ලීනා සහ බැල්බස් තීරණය කළේ දුප්පත්කම හේතුවෙනි. බෲටස් දරුවා මිල දී ගත් අතර, ඇයට නෝරා යනුවෙන් නම් තැබීය. අවුරුදු විස්සේ දී, නෝරා පුතෙකුට උපත ලබා දුන්නාය. පසුව අනාවරණය වූයේ, බෲටස්ගේ අන්තිම කැමති පත්‍රය මගින් නෝරා ගර්භණීව සිටින කාලය තුළ ඇයට නිදහස ප්‍රදානය කොට තිබූ බවයි. නෝරාගේ පුත්‍රයා වන ටිටියස් හට ඔහුගේ නෛතික තත්වය පිළිබඳව දැනගැනීමට අවශ්‍ය වී ඇත. ටිටියස් ට උපදෙස් දෙන්න.

(ii) මාසෙර්ලස් රෝමයේ ජීවත් වූ, ධනවත් ව්‍යාපාරිකයෙකි. අශ්වයකු පිටින් ඇද වැටීම නිසා මාසෙර්ලස් දරුණු ලෙස තුවාල ලබා සිටිනවිටදී, ඔහුගේ වහලුන්ගෙන් කෙනෙකු වන බැල්බස්, ඔහුව රැකබලා ගත්තේය. බැල්බස් වෙත නිදහස ප්‍රදානය කිරීමට, මාසෙර්ලස් අදහස් කරයි. මාසෙර්ලස්ට උපදෙස් දෙන්න.

02. පහත දක්වා ඇති අවස්ථාවන්හිදී, හේතු දක්වමින්, ඔගස්ටස් සතු වන දේපළ අයිතිවාසිකම් හා සම්බන්ධව, ඔහුට උපදෙස් ලබා දෙන්න.

(i) තමාගේ ඉඩමේ ප්‍රමාණවත් ඉඩකඩ නොතිබූ හෙයින්, ඔගස්ටස් තමා සතු අමුද්‍රව්‍ය භාවිත කරමින්, ඔහුගේ අසල්වැසියාගේ ඉඩමේ ගබඩාවක් ඉදිකිරීමට තීරණය කළේය.

අනෙක් පිටුව බලන්න

(ii) ඔහුගේ ගම්මානයේ කෙළවරෙහි තිබී, ඔගස්ටස්ට කරත්තයක් හමුවිය. ඔහු එහි හිමිකරු පිළිබඳව සොයා බැලුවද, හිමිකරු විසින් කරත්තය අතහැර දමා තිබූ බව, පසුව ඔහුට දැනගන්නට ලැබිණි. කරත්තය අත්පත් කරගැනීමට ඔගස්ටස්ට අවශ්‍ය වේ.

(iii) මාකස් යනු, රෝමයේ විසූ ප්‍රසිද්ධ ප්‍රේමාන්විත කවියෙකි. දිනක්, මාකස් ඔගස්ටස්ව මුණගැසීමට ගිය අවස්ථාවේදී, ඔහු ඔගස්ටස්ගේ රූමත් දියණිය දකින අතර, ඔගස්ටස් සතු පත්‍රිකාවක, ඔහු ඇය සඳහා කවියක් ලියුවේය.

(iv) පවුලස් දක්ෂ වඩු කාර්මිකයෙකු වූ අතර, ඔහු ඔගස්ටස් සතු දැව භාවිත කරමින් මේසයක් නිර්මාණය කළේය. ඔගස්ටස්ට එම මේසය හිමිකර ගැනීමට අවශ්‍ය වේ.

03. යම් දෙයක් පිළිබඳව වන පරම අවශේෂ අයිතිය (ultimate residual right) ලෙස රෝම හිමිකාරත්වය යම් හේතූන් නිසා නිර්වචනය කොට ඇත; හිමිකරුවෙක් සෑම අවස්ථාවකදී ම, හිමිකාරත්වය සම්බන්ධව අසීමාන්තික අයිතිවාසිකම් භුක්ති විඳින්නේ නැත. ඵල ප්‍රයෝජන ලැබීමේ අයිතිය (*usufruct*), සදා බදු හිමිකම (*emphyteusis)* හෝ ගොඩනැගිලි සම්බන්ධ බදු හිමිකම (*superficies)* ඇති හිමිකරුවාට භුක්ති විඳීම සඳහා පවතින පරම අයිතියකට වඩා වැඩියමක් හිමිවන්නේ නැත.

ඔබ එකඟ වන්නේ ද? අන්සතු කළහැකි අයිතිවාසිකම් (*jura in re aliena)* හි පැවතීම සම්බන්ධව අවධානය යොමු කරමින්, ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

04. පහත දක්වා ඇති අවස්ථා යටතේ, උද්ගතවන නෛතික ගම්‍යමානයන් සහ පාර්ශවයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් විස්තර කරන්න.

(i) ඇල්බටස් සහ මැග්නස් ළමාවියේ මිතුරෝය. මැග්නස් ව්‍යාපාරයක නිරතවෙමින් සිටි අතර මූල්‍යමය දුෂ්කරතාවයන්ට මුහුණ පෑවේය. ඔහු ඇල්බටස්ගෙන් ණයක් ඉල්ලා සිටි නමුත්, ඇල්බටස් සතුව ණයට ලබා දීම සඳහා ප්‍රමාණවත් මුදලක් නොතිබිණි. මැග්නස් හට මුදල් ණයට ලබා දෙන ලෙස, ඇල්බටස් තම අසල්වැසියා වන ජූලියන්ගෙන් ඉල්ලා සිටියේය. ඇල්බටස්ගේ වචන මත, ජූලියන් මැග්නස්ට මුදල් ණයට දුන්නේය. මාස හයක කාලයක් ඇතුළත, මැග්නස් මුදල් නැවත ජූලියන් හට

අනෙක් පිටුව බලන්න

ගෙවිය යුතු වන බවට එකඟවී තිබුණි. එකඟ වූ ආකාරයට ආපසු ණය ගෙවීමට මැග්නස් අපොහොසත් වුයේය.

(ii) පැට්‍රියන් බඩඉරිඟු වගාකරුවෙකු වූ අතර, විටස් ඔහුගේ ස්ථිර ගැනුම්කරුවන්ගෙන් කෙනෙකු විය. පැට්‍රියන් තමා සතු අක්කර පහක් වන බඩඉරිඟු වගා කළ භූමිය විටස් හට පෙන්වූ අතර, එකඟ වූ මිලක් සඳහා මාස දෙකක කාලයක් තුළ ඔහුට බඩඉරිඟු රාත්තල් දෙසියක් භාරදීමට එකඟ වූයේය. ඉන්පසු, විටස් තව මාස දෙකකින් ඔහුට පැට්‍රියන්ගෙන් ලැබෙන බඩඉරිඟු රාත්තල් දෙසීය, ටූලියන් හට විකිණීමට එකඟ වූයේය. ගංවතුර හේතු කරගෙන, පැට්‍රියන්ගේ බඩඉරිඟු වගාව විනාශ වූ අතර, එකඟ වූ ආකාරයට විටස් හට භාණ්ඩ භාරදීමට ඔහු අපොහොසත් විය.

ටූලියන් විටස්ගෙන් භාණ්ඩ භාරදෙන ලෙසට ඉල්ලා සිටියේය.

05. පහත දක්වා ඇති අවස්ථාවන් යටතේ, අදාළ පාර්ශවයන් සතු වගකීම සාකච්ඡා කරන්න.

(i) එක් දිනක් සඳහා වන ගමනක් යාමට ඇටිකුස්ට අයත් බූරුවා, කාටෝ විසින් ණයට ගත්තේය. ඉන්පසුව, ආසන්නයේ තිබුණු සැණකෙළියක් සඳහා ඔහු බූරුවාව රැගෙන ගිය අතර, ගාස්තුවක් යටතේ බූරුවා පිට නැගී ගමන් කිරීම සඳහා අවස්ථාව ලබා දුන්නේය. සැණකෙළිය අවසානයේ දී, කාටෝ, සයිරස් හට බූරුවාව විකුණුවේය.

(ii) සාදයකට හැඳපැළඳ ගෙන යාම සඳහා කාටෝ, ඇටිකුස්ට අයත් රත්රන් ශීර්ෂ පළඳනාව සහ දම් පැහැති සිල්ක් කබාය ණයට ගත්තේය. ටියුලියුස් විසින් මෙහෙයවන ලද දාමරිකයන් කණ්ඩායමක් සැඟවී සිට, කාටෝ අල්ලා ගෙන, පොලු මුගුරුවලින් ඔහුට දැඩිලෙස පහරදී, රත්රන් ශීර්ෂ පලදනාව සොරකම් කරගත්හ. ප්‍රහාරයේදී, රත්රන් ශීර්ෂ පළඳනාව පලුදු වූ අතර, දම් පැහැති සිල්ක් කබාය ඉරී ගියේය.

(iii) වෙළඳපළ දෙසට පැතිර ගොස් තිබූ, විශාල ගසක් කාටෝගේ වත්තෙහි තිබුණි. ස්වකීය භාණ්ඩ වෙළඳාමෙහි යෙදෙමින් ඇටිකුස්ගේ වහලා "මගේ රසවත් කේක් මිලදී ගන්න" යනුවෙන් කෑගසමින් ගස යටින් ගමන් කරන විටදී, කාටෝ ගසෙහි විශාල

අනෙක් පිටුව බලන්න

අතු කපමින් සිටියේය. අත්තක් කඩා වැටී වහලා මියගියේය. කාටෝ තර්ක කර සිටින්නේ, අත්ත කඩා වැටෙන විටදී, ඔහු ශබ්ද නගා අනතුරු අඟවමින් කෑගැසූ බවයි.

06. (i) පියාගේ අන්තිම කැමති පත්‍රය මගින් කැසියස්ට කිසිවක් හිමි කර දී නොමැති අවස්ථාවකදී, කැසියස් විසින් කටයුතු පරිපාලනය කරනු ලබන සහ කැසියස්ගේ ආරක්ෂාව යටතේ සිටින ලීනස් හට හිමිවන පරිදි කැසියස්ගේ පියා වන කාටෝගේ අන්තිම කැමති පත්‍රය මගින් ලබා දුන් දායාදයක් කැසියස් පිළිගෙන ඇත.

කැසියස් ට උපදෙස් දෙන්න.

(ii) කාටෝ තමන්ගේ පුත්‍රයා වන සයිරස් සහ තම බලය යටතේ සිටින වහලා වන ජූලියස් තම දේපළ සඳහා උරුමකරුවන් ලෙස පත් කරනු ලැබූ අතර, ඒ වෙනුවට ආදේශකයන් නම් කිරීමට අපොහොසත් විය. කාටෝගේ මරණයට පෙර, ජූලියස් මියගිය අතර සයිරස් හට දේපල භාරගැනීමට අවශ්‍ය වූයේ නැත.

මෙම අවස්ථාවේදී, අන්තිම කැමතිපත්‍ර රහිත අනුප්‍රාප්තිය ඇතිවිය හැකිද යන්න සාකච්ඡා කරන්න.

(iii) කාටෝ තමන්ගේ උරුමකරුවා ලෙස පත් කරන ලද කැසියස් හට තමන්ගේ දේපල හිමිකරදීමට කැමැත්තෙන් පසු වේ. එහිදී, කාටෝ ඉල්ලා සිටින්නේ, කැසියස්ගේ මරණයෙන් පසු, කැසියස් විසින් එකී දේපල, ලීනස් හට හිමි කර දිය යුතු බවයි. ඒ ආකාරයටම, ලීනස්ගෙන් ඉල්ලා සිටින්නේ, ලීනස් ගේ මරණයෙන් පසු, එකී දේපල සයිරස් හට හිමි කර දිය යුතු බවයි.

කාටෝ ට උපදෙස් දෙන්න.

******

අනෙක් පිටුව බලන්න